**ලංසු කැඳවීම**

**සෞඛ්‍ය හා ජනමාධ්‍ය අමාත්‍යාංශය**

**2025/2026 වසර සඳහා විජය කුමාරතුංග අනුස්මරණ රෝහල වෙත අමු ආහාර ද්‍රව්‍ය සැපයීම**

01. කොළඹ පාර සීදූව පිහිටි විජය කුමාරතුංග අනුස්මරණ රෝහලේ දෙපාර්තමේන්තු ප්‍රසම්පාදන කමිටු සභාපති විසින් 2025/2026 වසර වෙනුවෙන් රෝගීන් සහ කනිෂ්ඨ කාර්ය මණ්ඩලයට අවශ්‍ය අමු ආහාර අඛණ්ඩව සැපයීම සහතික කල හැකි සැපයුම්කරුවන්ගෙන් ජාතික තරඟකාරී ලංසු කැඳවීම යටතේ ලංසු කැඳවනු ලැබේ.

02. මේ පිළිබඳ උනන්දුවක් දක්වන පාර්ශවයන් විජය කුමාරතුංග අනුස්මරණ රෝහලේ ගණකාධිකාරී වෙත ආපසු නොගෙවනු ලබන ලංසු ලියවිලි ගාස්තු වශයෙන් රු. 3500.00 මුදලක් ගෙවා ලබා ගත් ලදුපත සමඟ ලිඛිත ඉල්ලීමක් හා තම ජාතික හැඳුනුම්පත් පිටපතක් ඉදිරිපත් කිරීමෙන් අනතුරුව **2025.06.02** වන දින සිට **2025.06.15**වන දින දක්වා සාමාන්‍ය රාජකාරී දිනවල පෙ.ව. 9.00 සිට ප.ව. 2.00 දක්වා කාලය තුළ විජය කුමාරතුංග අනුස්මරණ රෝහලේ ගණකාධිකාරී වෙතින් ලංසු ලියවිලි ලබා ගත හැකිය.

03. රෝහලට අදාළ ආහාර ඇස්තමේන්තුව පිළිබඳ විස්තර ලංසු ආකෘතිපත්‍ර සමඟ නිකුත් කරනු ලැබේ.

04. ශ්‍රී ලංකා මහ බැංකුව විසින් අනුමත කර ඇති වාණිජ බැංකුවකින් සීදූව , විජය කුමාරතුංග අනුස්මරණ රෝහලේ සභාපති නමට ලියන ලද ලංසු බැඳුම්කරයක් ලංසු භාර ගැනීම අවසන් වූ දින සිට දින 119 ක කාලයකට වලංගු වන සේ ලබාගෙන ඉදිරිපත් කළ යුතුය.(ඇමුණුම 03ආකෘතිය පරිදි) (**2025.06.16** දින සිට **2025.10.12** දක්වා වලංගු විය යුතුය.)

05. අයදුම්පත් බහාලන කවරයේ වම්පස ඉහළ කෙළවරේ **විජය කුමාරතුංග අනුස්මරණ රෝහල සඳහා අමු ආහාර ද්‍රව්‍ය සැපයීම 2025/2026"** යනුවෙන් පැහැදිලිව සටහන් කොට **2025.06.16** දින පෙ.ව.10.00 හෝ ඊට පෙර ලැබෙන සේ සභාපති දෙපාර්තමේන්තු ප්‍රසම්පාදන, විජය කුමාරතුංග අනුස්මරණ රෝහල, සීදූව යන ලිපිනයට ලියාපදිංචි තැපෑලෙන් එවීම හෝ එම ලිපිනයේ පිහිටි රෝහලේ ගිණුම් අංශයේ තබා ඇති ටෙන්ඩර් පෙට්ටියට බහාලීම හෝ කල යුතුය.

06. **2025.06.16** දින පෙ.ව. 10.00ට ලංසු භාර ගන්නා වේලාව අවසන් වූ වහාම ලංසු අයදුම්පත් විවෘත කරනු ලැබේ. ලංසු අයදුම්පත් විවෘත කරන අවස්ථාවට ලංසුකරුවන්ට හෝ ඔවුන්ගේ බලයලත් නියෝජිතයන්ට සහභාගී විය හැකිය. ප්‍රමාද වී ලැබෙන ලංසු අයදුම්පත් ප්‍රතික්ෂේප කරනු ලැබේ.

07. අසම්පූර්ණ ලංසු අයදුම්පත් හා අමුණා එවනු ලබන ලේඛනගත සාක්ෂි නිසි පරිදි සහතික නොකළ ලංසු අයදුම්පත්ද ප්‍රතික්ෂේප කරනු ලැබේ.

08. අදාළ ලංසු සම්පූර්ණයෙන්ම හෝ ඉන් කොටසක් පිළිගැනීමේ හෝ ප්‍රතික්ෂේප කිරීමේ අයිතිය විජය කුමාරතුංග අනුස්මරණ රෝහලේ දෙපාර්තමේන්තු ප්‍රසම්පාදන කමිටුව සතු වේ.

09. ලංසු ලියවිලි මුදල් ගෙවීමකින් තොරව විජය කුමාරතුංග අනුස්මරණ රෝහල් කාර්යාලයේදී සාමාන්‍ය රාජකාරී වේලාව තුළදී පරීක්ෂා කිරීමට හැකිය.

10.මේ සම්බන්ධයෙන් වැඩිදුර තොරතුරු සීදූව , විජය කුමාරතුංග අනුස්මරණ රෝහලේ ගණකාධිකාරී හෝ පරිපාලන නිලධාරී වෙතින් ලබාගත හැකිය. (දුරකථන අංක 011 2258862 -0112258864)

සභාපති,
දෙපාර්තමේන්තු ප්‍රසම්පාදන කමිටුව,
විජය කුමාරතුංග අනුස්මරණ රෝහල,
කොළඹ පාර
සීදූව .